# නුවණ වඩන - මන පුබුදන පොත්ගුල

කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි උසස් අධ්‍යාපනය ලැබූ හෝ දැනට එම ක්ෂේත්‍රයෙහි අධ්‍යයනයන්හි නියැලී සිටින බොහෝ දෙනා හඳුනන පර්යේෂණ පුස්තකාලය ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහි පුස්තකාලය හැඳින්විය හැකිය.

මෙම පුස්තකාලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ ආයතනයේ පර්යේෂණයන්ට අවශ්‍ය තොරතුරු, දත්ත හා සංඛ්‍යා ලේඛන ලබාදීමයි. පසුව එහි තොරතුරු හා ප්‍රලේඛන සේවාවන් ව්‍යාප්ත කිරීම පිණිස ගන්නා ලද ඇතැම් ධනාත්මක පියවරයන්හි ප්‍රතිඵලයක් ලෙසින් මෙම ස්ථාවරය වෙනස් කිරීමට සිදු විය.

ආයතනය සංස්ථාගත කිරීමේ පනතෙහි (Agrarian Research and Training Institute Act) 3 (1) (ඌ) වගන්තිය අනුව එහි එක් අරමුණක් වන්නේ කලාපීය අවශ්‍යතාවයන් ඉටු කරලීමට ආසියානු රටවල් සමඟ සහයෝගීව කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි ව්‍යුහාත්මක ගැටළුවලට සම්බන්ධ පර්යේෂණ කිරීම, කෘෂිකාර්මික ප්‍රශ්න පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ බෙද හැරීම සඳහා වූ මධ්‍යස්ථානයක් බිහි කිරීමයි.

මෙම අරමුණු පෙරදැරි කරගෙන 1972 තිඹිරිගස්යායේ එලිබෑන්ක් පාරේ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා එහි පුස්තකාලය ආරම්භ කෙරුණි. එවකට ග්‍රන්ථ 1490 ක හා වාර සඟරා 40 ක පමණ පුස්තක එකතුවකින් එය සමන්විත වූ අතර පුස්තකාලයේ සේවය සඳහා සිටියේ එක් නිලධාරිණියක් පමණි. මේ වන විට පුස්තකාලයට අවශ්‍ය පොත් මිල දී ගැනීමට අධාර සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඇමරිකානු ආධාර ආයතනය (USAID) උපකාරී වූ අතර ආසියා පදනම මඟින් ද පරිත්‍යාග වශයෙන් පොත් ලබා දෙනු ලැබීය.

එවකට පුස්තකාලය පැවතියේ ආයතනයේ සන්නිවේදන අංශයේ කොටසක් ලෙසිනි. ශ්‍රී ලංකාවේ ගොවි ගැටළු පිළිබඳ අධ්‍යයනයන් හා ඊට අදළ තොරතුරු හා ආයතනයේ පර්යේෂණ ක්ෂේත්‍ර අටක් සම්බන්ධ තොරතුරු පුස්තකාල එකතුවෙහි අන්තර්ගත විය.

1975 වසර, පුස්තකාලයාධිපතිවරයෙකු නොසිටි පුස්තකාලයට සුවිශේෂී වසරකි. ඊට හේතු වන්නේ, ආයතනයේම සේවය කළ විල්ෆ්‍රඩ් රණසිංහ මහතා ප්‍රථම පුස්තකාලයාධිපති වශයෙන් පත්වීමයි. මෙය පුස්තකාලයේ ඉදිරි ගමනට විශාල ශක්තියක් විය. සැබැවින්ම පුස්තකාල විද්‍යාව පිළිබඳ ඔහු සතුව පැවති දැනුම හා කාර්යශූර භාවය නිසාම ආයතනයේ පුස්තකාලය හා සම්බන්ධ උපදේශක වරයෙකු ලෙස සිටි ඩබ්.බී. දෙරකුඹුර මහතා විසින් පුස්තකාලයේ තොරතුරු සංවිධානය හා සැලසුම් කිරීම රණසිංහ මහතාට පවරන ලදී. මේ වන විට ඔහු ආයතන සේවයෙන් මෙන්ම තම දිවියෙන් ද සමුගෙන සිටියත්, වර්තමානයේ පුස්තකාලය විසින් පවත්වා ගෙන එනු ලබන සේවාවන්ට මූලික පදනම දැමුවේ ඔහු විසිනි.

1983 වසරේ දී පරිඝනක හා දත්ත සැකසුම් අංශය පවතින ගොඩනැගිල්ලට පුස්තකාලය ගෙන යනු ලැබීය. වසරින් වසර පුස්තකාලයට මිල දී ගනු ලබන පොත් පත් මෙන්ම පරිත්‍යාග හා ආධාර වශයෙන් ලැබෙන පොත් පත් වලින් ද පුස්තක එකතුව වර්ධනය වී තිබූ බැවින් දේශීය හා විදේශීය පොත් වෙනම රාක්ක ගත කර ප්‍රධාන පුස්තකාලය එම ස්ථානයෙහි ද, සඟරා පුස්තකය ආයතනයේ වෙනත් ස්ථානයකට ද රැගෙන යන ලදී.

එසේම, මේ වන විට දිවයිනේ පිහිටි පර්යේෂණ පුස්තකාල අතරෙහි ඉදිරියෙන්ම පැවතියේ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පුස්තකාලයයි. අනෙකුත් බොහෝ පුස්තකාලවල නොමැති දුර්ලභ ග්‍රන්ථ හා විදේශීය වාර ප්‍රකාශන මෙන්ම සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව

හා දේශපාලන විද්‍යාවට අදාළ ප්‍රකාශන විශාල ප්‍රමාණයක් පුස්තකාල එකතුවෙහි පැවතුණි. මේ නිසා පුස්තකාලයට පැමිණෙන බාහිර පාඨක සංඛ්‍යාව දිනෙන් දින වැඩි වෙමින් තිබුණි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තමා යටතේ අධ්‍යාපන කටයුතුවල යෙදෙන සිසුන්ගේ තොරතුරු, අධ්‍යයන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා යොමු කරනු ලැබුවේ ද මෙම ආයතනයේ පුස්තකාලය වෙතය.

එවකට පුස්තකාල විද්‍යාව හදරන සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම සිදු කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල කිහිපයක පමණි. ඉන් එක් පුස්තකාලයක් ලෙස ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුස්තකාලය ද එම කාර්යයට එක් වී තිබුණි. මෙයට අමතරව 1987 වසරේ දී ආසියානු පදනම ආයතනයේ ඉල්ලීම පරිදි මාලදිවයින් ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුට ද පුස්තකාල කටයුතු පිළිබඳ පුහුණුවක් ලබාදීම ද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

පුස්තකාලය සඳහා ම වෙන් වූ ගොඩ නැගිල්ලක අවශ්‍යතාවය සපුරමින් 1997 වසරේ දී වර්තමාන පුස්තකාලය පිහිටි ගොඩනැගිල්ල කරා ප්‍රධාන පුස්තකාලය හා සඟරා පුස්තකාලය ගෙන එන ලදී. පෙරට වඩා වැඩි පහසුකම් පාඨකයන් හට ලබාදීමට මෙම පුස්තකාල ගොඩනැගිල්ල සැලසුම් කර තිබුණි. ඒ අනුව, පුස්තකාලය අංශ දෙකකට වෙන් කොට ඇති අතර එක් අංශයක ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත ග්‍රන්ථ හා විදේශීය රටවල ප්‍රකාශිත ග්‍රන්ථ වෙන් වශයෙන් රාක්ක ගත කොට ඇත. අනෙක් අංශයෙහි සඟරා හා අනෙකුත් වාර ප්‍රකාශන, පුවත්පත් ලිපි එකතුව පවත්වාගෙන යනු ලැබේ. ආයතනයේ කාර්ය මණ්ඩලයට හා බාහිර පාඨකයන් සඳහා විමර්ශන පහසුකම් ද මෙහි සලසා ඇත.

1997 වසරේ දී පුස්තකාලයේ ඇති පොත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පරිඝනක ගත කිරීම ආරම්භ කරනු ලැබිය.

1975 සිට අද දක්වා පුසතකාලය විසින් ඉටු කරන ලබන සේවාවන් මෙසේ ය.

* ආයතනයේ කාර්ය මණ්ඩලයට හා බාහිර පාඨකයන් සඳහා තොරතුරු විමර්ශන පහසුකම් සැලසීම.
* අන්තර් පුස්තකාල හුවමාරුව :

  ආයතනයේ ප්‍රකාශ හුවමාරු වැඩපිළිවෙල යටතේ ආයතනය විසින් ප්‍රකාශිත ග්‍රන්ථ සහ වාර ප්‍රකාශන අනෙකුත් පුස්තකාල හා ආයතන වෙත යැවීම හා එම ආයතන විසින් එවනු ලබන ප්‍රකාශන ලබා ගැනීම.
* අන්තර් පුස්තකාල පිරුළු සේවය :

  පුස්තකාලයේ නොමැති ග්‍රන්ථ හෝ වාර ප්‍රකාශන පාඨක අවශ්‍යතාවය අනුව බාහිර පුස්තකාලවලින් (යම් කිසි කාලසීමාවක් සඳහා) ලබාදීම. වෙනත් පුස්තකාලවල පාඨක ඉල්ලීම් ද ඒ අයුරින් ඉටු කිරීම.
* ප්‍රවර්තන සාවධාන සේවාව :

  පුස්තකාලය හා සම්බන්ධ අනෙකුත් සෑම පුස්තකාලයකම ඉල්ලීම අනුව හා පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව නවතම වාර සඟරාවන් හි පටුන පිටු (Content Pages) ඔවුන් වෙත යැවීම.
* ජායා පිටපත් සේවය

  මෙය ආයතනයේ පාඨකයින් හට පමණක් නොව බාහිර පාඨකයන් සඳහා ද ක්‍රියාත්මක වේ. පුස්තකාලයේ ඇති ප්‍රකාශනවල (උපාධි නිබන්ධන හැර) ජායා පිටපත් ඉතා අඩු මුදලකට ලබාදීම.

පුස්තකාල ජාල හා සම්බන්ධ සේවාව

කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව මඟින් පවත්වා ගෙන යනු ලබන කෘෂිකාර්මික තොරතුරු ජාලය වෙත පුස්තකාලයේ ඇති කෘෂිකර්මයට අදාළ ග්‍රන්ථවල විද්‍යාත්මක තොරතුරු ලබා දීම. තෝරා ගත් වාර ප්‍රකාශනවල පටුන පිටු එම පුස්තකාල ජාලයට සම්බන්ධ පුස්තකාලවලට යැවීම සහ එම පටුන පිටු ආශ්‍රයෙන් තෝරා එවන ලබන සඟරා ලිපි පුස්තකාල වෙත යැවීම.

1973 සිට 2008 දක්වා පුස්තකාලය සතු ග්‍රන්ථ වර්ධනය මෙසේ දැක්විය හැකිය.

| වර්ෂය | ප්‍රමාණය |
|---|---|
| 1973 | 1,490 |
| 1980 | 6,060 |
| 1985 | 8,556 |
| 1990 | 11,762 |
| 2000 | 17,510 |
| 2005 | 19,701 |
| 2008 | 21,773 |

*(පුස්තකාල ප්‍රතිග්‍රහන ලැයිස්තුවලින් උපුටා ගන්නා ලදි.)*

1975 වසරේ දී පුස්තකාලය සතුව තිබූ වාර සඟරා සංඛ්‍යාව 42 ක් විය. වර්තමානය වන විට මෙම වාර සඟරා සංඛ්‍යාව 82 දක්වා වර්ධනය වී ඇත. මෙයට අමතරව නොයෙකුත් විෂයයන්ට අදළ වාර ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් පුස්තකාලයට ලැබෙමින් පවතී.

තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ පුස්තකාලය විසින් ඉටු කරනු ලබන කාර්යයන් නව මුහුණුවරක් ගනු ලැබීය.

1997 වසරේ පුස්තකාලයේ ඇති ග්‍රන්ථවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පරිඝනක ගත කිරීම සඳහා CDS/ISIS නමැති පරිඝනක මෘදුකාංගය උපයෝගී කර ගත් අතර පසුව 2002 වසරේ සිට වඩාත් දියුණු කළ WIN/ISIS පරිඝනක මෘදුකාංගය යොද ගනු ලැබීය.

2007 වසර දක්වාම කෘෂිකාර්මික තොරතුරු ජාලයට හා සම්බන්ද පුස්තකාල සඳහා යනු ලබන පටුන පිටු සහ වාර සඟරා, ලිපි, ජායා පිටපත් මඟින් එම පුස්තකාල වෙත යැවුණි. වර්තමානය වන විට එම කටයුතු විද්‍යුත් තැපැල (e-Mail) මඟින් සිදු කරනු ලබයි.

පුස්තකාලය ආයතනයේ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව පුස්තකාලයේ ඇති නව වාර ප්‍රකාශන පිළිබඳ තොරතුරු ද විද්‍යුත් තැපැල මඟින් යවනු ලැබේ.

මෙයට අමතරව, කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් (Internet) විද්‍යුත් තැපැල (e-Mail) පහසුකම් පුස්තකාලය විසින් සපයනු ලැබේ.

1972 සිට වර්තමානය දක්වා පුස්තකාලය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට හා බාහිර පාඨකයන් හට ඉටු කරන සේවාවන් කුමන බාධක මධ්‍යයේ වුව ද පවත්වා ගෙන යාමට හැකිවීම සතුටට කරුණකි. මෙම වසර 37 තුළ බොහෝ කාල පරිච්ඡේදයන් හි පුස්තකාලයේ මානව සම්පත්වල හිඟකමක් පැවතිය ද, එම අඩුව පාඨකයන් හට බාධාවක් නොවන පරිදි ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවන් නියමිත වේලාවට ඉටු කර දීමට පුස්තකාල කාර්ය මණ්ඩලයට හැකිවීම පුස්තකාලය ලැබූ ජයග්‍රහනයක් සේ සැලකිය හැකිය.

**යමුනා ප්‍රියදර්ශනී වීරරත්න**
***සහකාර පුස්තකාලයාධිපතිණී***
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## ගොවි ජනතා

**'ගොවි ජනතා'** සහරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සළකමු. එසේම, ඒවා ඉදිරි කලාපයන් හි පල කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්, එවැනි ද සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.

**සංස්කාරක**
**ගොවිජනතා**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.**
**114, විජේරාම මාවත.**
**කොළඹ - 07.**